# මාසික මහා සභා රැස්වීම

# 2023.02.14

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2023.02.14 |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,

1. ටී.එම්.ඒ.එන්.බී. හඳගම මැතිතුමා

ගරු උප සභාපති ,

2. එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී / මන්ත්‍රිනි,

1. එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය
2. අයි.පී.එස්.පි.කේ.රණවීර මැතිතුමා
3. ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා
4. ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමා
5. අයි. සිරිසේන මැතිතුමා
6. අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමා
7. ජේ.ඩී පද්මතිලක මැතිතුමා
8. ඩබ්.පී. සුමිත් රත්නකුමාර මැතිතුමා
9. ආර්.එස්.එස් ගුණතිලක මැතිතුමා
10. එච්. එම්. තිලකරත්න මැතිතුමා
11. එස්.ඒ.එස්.පී ධර්මසේන මැතිතුමා
12. එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා
13. පී.ජී.එන්.පී රාජපක්ෂ මැතිතුමා
14. පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමා
15. ජේ.එම්.ඒ.එස් ජයසිංහ මැතිතුමිය
16. කේ.එම්.ඩී.එම් බණ්ඩාර කුලසේකර මැතිතුමා
17. එස්.පී.ආර්.ඒ පියරත්න මැතිතුමා
18. කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා
19. එස්.එම්.ආර්.ටී.බණ්ඩාර මැතිතුමා
20. ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා
21. ආර්.බී.පී වීරසිංහ මැතිතුමා
22. එච්.ජී.එල් සරත් කුමාර මැතිතුමා
23. පී.ඒ.පී තිලකරත්න මැතිතුමිය
24. ආර්.එම්. එස්. රණසිංහ මැතිතුමා
25. අර්.එම්.එස්.එස්.බණ්ඩාර රත්නායක මැතිතුමා
26. එච්.ආර්. ජී. එච්. බී. ජයසේකර මැතිතුමා
27. ආර්.එම්.ආර්.කේ රත්නායක මැතිතුමිය
28. එම්.එෆ්. අස්මියා මැතිතුමිය
29. කේ.ජී. උපාලි කුමාර අබේරත්න මැතිතුමා
30. කේ.ඒ.සී අමන්දා මැතිතුමිය
31. පී.ජී මල්ලිකා මැතිතුමිය
32. එච්.ආර්.ආර් මැණිකේ මැතිතුමිය
33. එල්.එල්. නලින් බුද්ධික ජයසූරිය මැතිතුමා

**නිලධාරී සහභාගිත්වය**

❖ ආර්.එම්.පී රත්නායක මිය - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිට මිය ගිය අය,රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## අ). 2023.01.10 මහ සභා වාර්තාව සම්මත කිරීම.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

2023.01.10 දිනැති මහ සභා වාර්තාව කියවුවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසද, නොඑසේ නම් 2023.01.10 දිනැති මහ සභා වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙසද ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමා

2023.01.10 දිනැති මහ සභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව 2023.01.10 දිනැති මහ සභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත විය.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

2023.01.10 දිනැති මහ සභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

## ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මේ දිනවල ඩෙංගු වසංගතය ඉතාම සීඝ්‍රයෙන් පැතිරෙන අතර ඩෙංගු වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාව හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සමඟ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර ඇති බවත් ඉදිරි දිනවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

### i. නිවාඩු අනුමැතිය

1. අසනීප බැවින් 2023.02.14 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.ජී.නවරත්න බණ්ඩාර මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදී.ඒ අනුව 2023.02.14 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.ජී.නවරත්න බණ්ඩාර මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දීම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදී.

## ඇ). සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාගත කිරීම.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

1. 2018 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන සඳහා පවත්වන මැතිවරණයෙන් යූ.ජී.උදය ප්‍රසාද් තිලකරත්න මහතා (හැ.අ. 733023945V) මෙම සභාව වෙත එක්සත් ජනතා නිදහස් සංධානයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වන ලදී.නමුත් 2023.01.11වන දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී.උදය ප්‍රසාද් තිලකරත්න මහතා හදිස්සියේ ඇති වූ හෘදයාබාධයක් හේතුවෙන් අභාවප්‍රාප්ත වූ බව කණගාටුවෙන් දැනුම් දෙන බව සඳහන් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමාගේ හදිසි අභාවය සිදු වූ අවස්ථාවේ සිට දානමය කටයුතු දක්වා නන් අයුරින් සහයෝගය දැක්වූ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුදෙනාට ලබාදුන් සහයෝගය වෙනුවෙන් ගෞරවණීය ස්තූතිය පුද කරමින් එතුමාගේ බිරිද ඇතුළු පවුලේ සියලුදෙනා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

අද දින ඉදිරිපත් කිරීමට කල් දී ඇති ප්‍රශ්න නොමැති බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ඉ). යථා පරිදි කල්දී ඇති යෝජනා**

i. 2022.12.31 දිනට අවසන් වර්ෂය සඳහා සැකසූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීමට තීරණය විය.

ii. රඹුක්කන බංඩාරනායක ප්‍රජා ශාලාවේ පැරණි ගොඩනැඟිල්ල කඩා ඉවත් කර නව තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට ආදාළ ව්‍යාපෘතිය සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ආර්.ටී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

නව තෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම මහ සභාවේ අනුමැතියට යටත්ව සිදු කළ යුතු බැවින් මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කිරීමට තීරණය විය.

iii. 2023 වර්ෂය සඳහා අක්කර බදු තක්සේරු නිවේදන ලිවීම සහ පරික්ෂා කිරීම වෙනුවෙන් දීමනා ලබාගැනීම.

- අක්කර බදු තක්සේරු නිවේදන ලිවීම ඒකකයට - රු.4.00
- අක්කර බදු තක්සේරු නිවේදන ලිවීම පරීක්ෂා කිරීම ඒකකයට - රු.2.00
- අක්කර බදු ඒකක ගණන - 776

තක්සේරු නිවේදන ලිවීම සඳහා දීමනාව - රු.4.00 x 776 -3104.00 (බී.එන්.කේ.ගමගේ මිය)
තක්සේරු නිවේදන පරීක්ෂා කිරීම සඳහා දීමනාව - රු.2.00 x 776 – 1552.00 (පී.ජී.එස්.කුමාරි මිය)
ඉහත දීමනා ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

තක්සේරු නිවේදන ලිවීම සඳහා දීමනාව ලබාදීමට තීරණය විය.

iv. කිවුල්පන පුරාණ විහාරස්ථානයේ දාන ශාලාව වැඩි දියුණු කරගැනීමට දාන ශාලාව පිටුපස ඉවුර කපාගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ JCB යන්ත්‍රය ලබාගැනීම සඳහා ඉල්ලීමක් සිදු කර ඇති අතර එම කටයුතු සඳහා JCB යන්ත්‍රය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.එස්.කෝ.කේ.සුමනසේකර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

JCB යන්ත්‍රය මුදල් අය කිරීමකින් තොරව ලබාදීමට තීරණය විය.

v. 2022 සැප්තැම්බර් මාසයට ආදාළව මෙම කාර්යාලයේ නිලධාරින් විසින් ලබාගත් නිදහස් දුම්රිය බලපත්‍ර (නිවාඩු) සඳහා රු.146,000.00 ක මුදලක් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු.146,000.00 ක මුදල ගෙවීමට තීරණය විය.

vi. 2022 වර්ෂය සඳහා බලපත්‍ර,ව්‍යාපාර බදු, සංචාරක හෝටල් සඳහා මුදල් ලබාගැනීම වෙනුවෙන් ආර්.ප්‍රදීපා සංජීවනි ජයතිස්ස මිය - රු.2.00 බැගින් 1162ක් සඳහා රු.2324.00 ගාස්තුව ගෙවීමට සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස්.පී ධර්මසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

මුදල ගෙවීමට තීරණය විය.

vii. 2023.02.21,22,23,24,27,28 හා මාර්තු 02,03 දිනයන්හි රඹුක්කන බතඹුරය ක්‍රීඩාංගනය කෑ/මාව හිරිවඩුන්න මහා විද්‍යාලය වෙත නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. බතඹුරය ක්‍රීඩාංගනය නොමිලේ ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ගාස්තු අය කිරීමකින් තොරව ලබාදීමට තීරණය විය.

viii. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු පහත නම් සඳහන් නිලධාරී හා සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම අනුව සේවක ණය මුදල් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ රණවීර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

1. ඩබ්.ඒ.සි.එස්. වනසිංහ මිය - රු. 100,000.00
2. ආර්.එම්.එස්.ඒ.රත්නායක මයා - රු. 100,000.00
3. එච්.සි.කේ.හෙට්ටිගොඩ මයා - රු. 100,000.00
4. ආර්.පි.එස්.යූ.කේ.රණසිංහ මයා - රු. 43,663.00
5. බි.අයි.එම්.ඩි.කේ.බංඩාරනායක මිය - රු. 37,534.00
6. පි.ජී.එස්.කුමාරි මිය - රු. 100,000.00

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ණය මුදල් ලබාදීමට තීරණය විය.

ix. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සේවයේ නියුතු කම්කරු මහතුන් 2023 පෙබරවාරි මාසය සඳහා දෛනික වැටුප් ගෙවීමට සකස් කරන ලද රු.375,000.00 ඇස්තමේන්තු මුදල අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එස්.කේ.කේ.සුමනසේකර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු.375,000.00 ඇස්තමේන්තු මුදල අනුමත කිරීමට තීරණය විය.

x. කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ මේවන විට එකතු වී ඇති කසල ප්‍රමාණය වෙනත් ස්ථානයකට රැගෙන යාම සඳහා රු.650,600.00 මුදලක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්.අනුලාවතී මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා .

වර්ග නොකරන ලද කසල කොම්පෝස්ට් අංගනය වෙත රැගෙන එන අතර දිරන කසල පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන බවත් ඉන් පසු ඉතිරිවන ද්‍රව්‍ය ප්‍රමාණය එක්රැස්කර වෙනත් ස්ථානයකට රැගෙන යා යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.ඒවා වසරකට එක්වරක් පමණක් සිදු කරන බවත් එතුමන් විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු.650,600.00 ඇස්තමේන්තු මුදල අනුමත කිරීමට තීරණය විය.

xi. 2023.01.09 සිට 2023.01.31 දක්වා උපලේඛන අංක 01හි සඳහන් වියදම් දැරීම සුදුසු බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්.අනුලාවතී මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

| දිනය | වවු.අංක. | නම | විස්තරය | වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 2023.01.09 | 1 | මුදල් භාරකරු | රඹුක්කන ප්‍රා.ස මහා සභාව සහ වෙනත් සභාවේ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය සංග්‍රහ ද්‍රව්‍ය ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 20000.00 |
| | 2 | පෝස්ට් මාස්ටර් ජෙනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම. | 30000.00 |
| | 3 | සී/ස රඹුක්කන වී.සේ.ස.ස | 2022 පොදු අරමුදල්.ගංගොඩ සමගි මාවත සංවර්ධනය කිරීම. | 225000.00 |
| | 4 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | මෙම සභාවේ සේවය කරන ආයුර්වේද වෛද්‍ය ඩී.ආර්.මංගලිකා මියගේ තෛයිමාසික දුම්රිය වාර ප්‍රවේශ පතුය සඳහා මුදල් ගෙවීම. | 6300.00 |
| 2023.01.10 | 5 | මුදල් භාරකරු | සහික දීමනාව | 234065.64 |
| | 6 | මුදල් භාරකරු | 2323 ජනවාරි මස ස්ථිර සේවක වැටුප් අත්තිකාරම් ගෙවීම. | 8000.00 |
| | 7 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 12000.00 |
| | 8 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 8000.00 |
| | 9 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 112000.00 |
| | 10 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 20000.00 |
| | 11 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 190000.00 |
| | 12 | මීදුම මිහිදු ග්‍රාම සංවර්ධන සමිතිය. | 2022 පොදු අරමුදල්.හුරිමලුව වරකාතැන්න සුසාන භූමි මාර්ගය සංවර්ධනය කිරීම. | 240458.89 |
| | 13 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 30000.00 |
| | 14 | ඒ.ඩබ්.ජයරත්න මයා. | සභාව සතු ඇමුණුමෙහි සඳහන් වාහන වල වාර්ෂික දූම සහතික ආධායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 13410.00 |
| | 15 | සාමාන්‍යාදිකාරී/සී.ස.වී.සේ.ස.ස | රඹුක්කන ප්‍රා.ස වී.සේ.ස.සමිතියේ 2023 වර්ෂය සඳහා ඉන්දන ලබා ගැනීමට ඇප මුදල් තැන්පත් කිරීම. | 600000.00 |
| | 16 | සාමාන්‍යාදිකාරී/සී.ස.වී.සේ.ස.ස | 2022 දෙසැම්බර් මස ඉතිරි ඉන්ධන බිල්පත් මුදල් ගෙවීම. | 194560.00 |
| | 17 | සාමාන්‍යාදිකාරී/සී.ස.වී.සේ.ස.ස | 2022 දෙසැම්බර් මස ඉතිරි දින සඳහා ඉන්දන බිල්පත් මුදල් ගෙවීම. | 165181.00 |
| | 18 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2022 පොදු අරමුදල්.සතිපොළ භූමියේ රුක් රෝපනය සඳහා සුද්ද කර වලවල් කැපීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 142800.00 |
| | 19 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 40000.00 |
| | 20 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 8000.00 |
| | 21 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 4000.00 |
| 2023.01.13 | 22 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2022 පොදු අරමුදල්.ගොඩගන්දෙණිය කුඹුරු යායට අදාල ඇල මාර්ගයේ රොන්මඩ ඉවත් කිරීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 62900.00 |
| | 23 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2022 පොදු අරමුදල්.නගරයේ කාණු පද්ධතිය සුද්ද කිරීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 292400.00 |
| | 24 | පින්නවල ග්‍රාමීය වැඩිහිටි කමිටු සංවිධානය | 2022 පොදු අරමුදල්.හිරිවඩුන්න කන්දෙපොල මාර්ගය සංවර්ධනය කිරීම.රැඳවුම් මුදල් ගෙවීම. | 14793.06 |

| | | | | |
|---|---|---|---|---|
| | 25 | පින්නවල ග්‍රාමීය වැඩිහිටි කමිටු සංවිධානය | 2022 පොදු අරමුදල්.හිරිවඩුන්න කන්දෙපොළ මාර්ගය සංවර්ධනය කිරීම.රැඳවුම් මුදල් ගෙවීම. | 30000.00 |
| | 26 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල්.හේවාදිවෙල පතිනිගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම.අවසන් බිල්පත පියවීම. | 135000.00 |
| 2023.01.16 | 27 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 8000.00 |
| | 28 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 100000.00 |
| | 29 | කේ.කේ.හේමන්ත මයා. | කාර්යාලය වෙත ප්‍රා.ස ශ්‍රවනාගාරය වෙන් කිරීමේ ලේඛනයක් සාදා සැපයීම. | 3500.00 |
| | 30 | කේ.කේ.හේමන්ත මයා. | කාර්යාලය වෙත බණ්ඩාරණායක ප්‍රජා ශාලාව වෙන් කිරීමේ ලේඛනයක් සාදා සැපයීම. | 3500.00 |
| | 31 | කේ.කේ.හේමන්ත මයා. | කාර්යාලය වෙත වැටුප් ලේඛනයක් සාදා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4500.00 |
| | 32 | කේ.කේ.හේමන්ත මයා. | කාර්යාලය වෙත අශෝක ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ලේඛනයක් සාදා සැපයීම. | 3500.00 |
| | 33 | කේ.කේ.හේමන්ත මයා. | කාර්යාලය වෙත මහීපාල හේරත් ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ලේඛනයක් සාදා සැපයීම. | 3500.00 |
| | 34 | කේ.කේ.හේමන්ත මයා. | රඹුක්කන මහජන පුස්තකාලය වෙත සාමාජික ඉල්ලුම් පත් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3900.00 |
| | 35 | කේ.කේ.හේමන්ත මයා. | ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලය වෙත සමාජික අයදුම් පත් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් ගෙවීම. | 3900.00 |
| | 36 | Sri Lanka Insurance coroporation (Pvt)Ltd | සභාව සතු SG.YU-6935 අංක දරණ බජාජ් ත්‍රී රෝද රථයේ රක්ෂණාවරණය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8241.56 |
| | 37 | පළාත් ලාළන කොමසාරිස් | මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ 1% දිරි දීමනා ගෙවීම. | 9048.41 |
| | 38 | Sri Lanka Insurance coroporation (Pvt)Ltd | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ දේපල සඳහා 2023/2024 වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු ගෙවීම. | 33412.48 |
| | 39 | එල්.එල්.ඩී.කේ.ලියනගේ මයා. | ජල නල එලීමට අදාලව තැන්පත් කළ ඇප මුදල් ආපසු ගෙවීම. | 2000.00 |
| | 40 | කරිදු මෝටර්ස් | රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ගල්රෝල අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 99500.00 |
| | 41 | Universal Office Automation | නිවාඩු විෂය රාජකාරී කටයුතු සඳහා Wifi Dongal එකක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4350.00 |
| | 42 | Universal Office Automation | නිවාඩු විෂය රාජකාරී කටයුතු සඳහා Key Board එකක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1950.00 |
| | 43 | අයිවරි විනර්ස් ක්‍රීඩා සමාජය | 2022.12.24 දින බතඹුරය ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප තැන්පතු ආපසු ගෙවීම. | 1000.00 |
| | 44 | එස්.එම්.කේ.බී.සමරකෝන් | කොම්පෝස්ට් අංගනයේ පොලිතීන් සම්පීඩන යන්ත්‍රය මගින් සකසන පොලිතීන් කුට්ටි ගැටගැසීම සඳහා නයිලෝන් ලණු රෝල් 05ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12500.00 |
| | 45 | එස්.එම්.කේ.බී.සමරකෝන් | කාර්යාලීය අවශ්‍යතාවයන් සඳහා ඉබි යතුරු 04 ක් හා කොන්ඩිපට්ටම 04ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3200.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 46 | Suoun Trade Center | මාර්ග අංශයේ සේවකයන් භාවිතා කරණු ලබන තණකොළ කපන යන්ත්‍ර සඳහා යෙදීමට තළ 04ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2400.00 |
| | 47 | දිසානායක පුත්‍රයෝ | කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය සවිකිරීම සඳහා අවශ්‍ය විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම. | 3640.00 |
| | 48 | මුදල් භාරකරු | අත්තිකාරම් පියවීම. | 20000.00 |
| | 49 | මහනුවර ට්‍රේඩර්ස් | සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ පරිහරණය සඳහා රබර් ග්ලවුස් ජෝඩු 10ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3000.00 |
| | 50 | දේශීය ආධායම් දෙපාර්තමේන්තුව | ලි.ප.අං.409136419-6001 යටතේ 2022/10/0 සිට 2022/12/31 දක්වා මුද්දර බදු ගෙවීම. | 46196.00 |
| | 51 | ඩබ්.එම්.එල්.පී.රණසිංහ මයා. | පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණ නවතා තබන වාහන වලින් ගාස්තු අය කිරිම වෙනුවෙන් 2022.05.30දින සිට 2022.12.31 දක්වා කාලයට එකත් කළ මුදලින් 20%ක කොමිස් මුදල ගෙවීම. | 118320.00 |
| 2023.01.17 | 52 | කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්-ජනවාරි මාසය | 584.00 |
| | 53 | ඩබ්.ඒ.ටී.මධුශංක | ගමන් වියදම්-ජනවාරි මාසය | 700.00 |
| | 54 | කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්-ජනවාරි මාසය | 584.00 |
| | 55 | කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්-දෙසැම්බර් මාසය | 5600.00 |
| | 56 | එස්.ජේ.එස්.සමරසිංහ මයා. | අතිකාල දීමනා - දෙසැම්බර් මාසය | 1109.21 |
| | 57 | සභාපති/ලේකම් රඹුක්කන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගලි තැන්පතු ආදායමට ගැනීම. | 135170.00 |
| | 58 | මුදල් භාරකරු | 2023 වර්ෂය සඳහා විශේෂ අත්තිකාරම් ගෙවීම. | 16000.00 |
| | 59 | මුදල් භාරකරු | 2024 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ගෙවීම. | 60000.00 |
| | 60 | එන්.එම්.පී.එස්.නවරත්න මිය. | ගමන් වියදම්-දෙසැම්බර් මාසය | 4000.00 |
| | 61 | බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය. | රඹුක්කන ප්‍රාදේශීය සභා මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහනේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් විෂය නිළධාරි විසින් පෞද්ගලිකව වියදම් කළ මුදල ආපසු ගෙවීම. | 3358.00 |
| 2023.01.19 | 62 | ශ්‍රී මලියදේව වැඩිහිටි සුභසාධක සමිතිය. | 2022 පොදු අරමුදල්.පුවක්මොටේ අලුත්ගෙදර වත්ත මාර්ගයේ පාගම ඉදි කිරීම. | 90000.00 |
| | 63 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල්.මැදගලදෙණිය සමිති ශාලා මාර්ගය සංවර්ධනය කිරීම.අවසන් බිල්පත පියවීම. | 135000.00 |
| | 64 | එම්.එච්.එම්.රිස්මි | 2022.12.23,24,25 දිනයන්හි ප්‍රජා ශාලාව වෙන් කිරීමේ ඇප තැන්පතු ආපසු ගෙවීම. | 3352.00 |
| | 65 | සභාපති රඹුක්කන ප්‍රාදේශීය සභාව | පොදු වෙළඳපොළ අංක 33 ගව මස් කඩ කාමරය 2023 වර්ෂයට බදු ලබා ගත් ඒ.එෆ් .අමීර් මහතාගේ ටෙන්ඩර් ඇප මුදල බදු කුලී සඳහා හිලව් කිරීම. | 15000.00 |
| | 66 | සභාපති රඹුක්කන ප්‍රාදේශීය සභාව | පී.වී.සී.ප්‍රියන්තා මිය 2023 හේවාදිවෙල අංක 02 ඌරුමස් කඩය සඳහා ලංසු ඉදිරිපත් කිරිමට තැන්පත් කළ ටෙන්ඩර් ඇප මුදල 2023 ජනවාරි මස බදු කුලියට හිලව් කිරීම. | 15000.00 |
| | 67 | ඒ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 1890.00 |
| | 68 | ඒ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 700.00 |
| | 69 | ඒ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 584.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 70 | ඒ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 810.00 |
| | 71 | අධ්‍යක්ෂ,පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය. | පළාත් පාලනය පිළිබඳ කෙටිකා වැඩමුළුව සඳහා මෙම සභාවෙන් සහභාගී වන නිලධාරීන් දෙදෙනාගේ පිරිවැය ගෙවීම. | 12000.00 |
| 2023.01.23 | 72 | මොරගොල්ල ග්‍රාම සංවර්ධන සමිතිය. | 2022 පොදු අරමුදල්.පිටවල මන්සන්දියේ සිට හේන දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. | 41872.51 |
| | 73 | කොටවැල්ල ගොවි සංවිධානය. | 2022 පොදු අරමුදල්.කොටවැල්ල නැහැල්ම ගමමැද මාර්ගය සංවර්ධනය කිරීම.රැඳවුම් මුදල ගෙවීම. | 44228.38 |
| | 74 | මොරගොල්ල ග්‍රාම සංවර්ධන සමිතිය. | 2022 පොදු අරමුදල්.සමන්මෙඩවත්ත පළමු අදියර කමත පාර සංවර්ධනය කිරීම රැඳවුම් මුදල ගෙවීම. | 14977.40 |
| 2023.01.24 | 75 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල් හිරිවඩුන්න හපුලන්ද වත්ත මාර්ගය සංවර්ධනය කිරීම.අවසන් බිල්පත පියවීම. | 135000.00 |
| | 76 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල්. උඩගලදෙණිය ආදා ඇල හරහා යන අකුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම.අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 135000.00 |
| | 77 | Kegalle Distributers(Pvt)Ltd | ආදාහනාගාරය වෙත 37.5Kg ලිට්රෝ ගෑස් සිලින්ඩර 06ක් මිලදී ගැනීම සඳහා ගෙවීම. | 107064.00 |
| | 78 | බී.ඒ.සුගතදාස මයා. | රඹුක්කන ප්‍රාදේශිය සභාවට අයත් දෙවන වෙළඳ සංකීර්ණයේ ඇති වැසිකිලි වලවල් උතුරා යාම හේතුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය යොදා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 15340.00 |
| | 79 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල්.ආදොළුව සිට මාදන කිරිඅම්බාව මාර්ගය සංවර්ධනය කිරීම. අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 270000.00 |
| | 81 | සී/ස රඹුක්කන වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල්.කමතවත්ත මාර්ගය සංවර්ධනය කිරීම.අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 135000.00 |
| | 82 | ඊරියාව එකමුතු ගොවි සංවිධානය | 2022 පොදු අරමුදල්.දියසුන්නත අශෝක මාවත පළමු පටුමග බෝක්කු බට දෙක අලුත්වැඩියා කිරීම.අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 292500.00 |
| | 83 | මුදල් භාරකරු | 2023 ජනවාරි මස ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 4908392.65 |
| | 84 | මුදල් භාරකරු | 2023.01.11 සිට 01.31 දක්වා සභික දීමනාව ගෙවීම. | |
| | 85 | මුදල් භාරකරු | 2023 වර්ෂය සඳහා විශේෂ අත්තිකාරම් ගෙවීම. | 16000.00 |
| | 86 | මුදල් භාරකරු | 2023 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ගෙවීම. | 50000.00 |
| | 87 | මුදල් භාරකරු | 2023 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය ඉල්ලීම. | 1000.00 |
| | 88 | දිස්නා ලසන්ති ගුණවර්ධන මිය. | ඇලිවල ශ්‍රී සීවලී පෙරපැසැලේ පරිහරණය කරණු ලබන 12.5Kg ගෑස් සිලින්ඩරයට ගෑස් පිරවීම සඳහා පෙර පැසැල් පාලිකා දිස්නා ලසන්ති මිය පෞද්ගලිකව වැය කළ මුදල ආපසු ගෙවීම. | 5360.00 |
| | 89 | මුදල් භාරකරු | බලඹුරය ක්‍රීඩාංගනයේ පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා ඩබ්.ඒ.ටී.මධුශංක මයා විසින් පෞද්ගලිකව වියදම් කළ මුදල ගෙවීම. | 1500.00 |
| | 90 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | | |

| | | | | |
|---|---|---|---|---|
| | 91 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2023 පොදු අරමුදල්.හිනාබෝව ඉහළවෙල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 71400.00 |
| | 92 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | 2022 සැප්තැම්බර් මාසයට අදාලව කාර්යාල නිලධාරීන් විසින් ලබා ගන්නා ලද නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම. | 146500.00 |
| | 93 | බී.එන්.එන්.එස්.ජයකොඩි මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 2800.00 |
| | 94 | ඩී.ජී.සී.ඩී.එස්.කුමාරි මිය. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 3600.00 |
| | 95 | එස්.එම්.කේ.බී.සමරකෝන් මයා. | මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන සඳහා 20m මිණුම් ටේප් 03ක් සැපයීම වෙනුවෙන් ගෙවීම. | 4350.00 |
| | 96 | එස්.එම්.කේ.බී.සමරකෝන් මයා. | දැලිවල ශ්‍රී සීවලී පෙරපැසැලේ ඇතුළත හා පිටත බිත්ති වල ක්‍රීඩා භාණ්ඩ වල හා ඩෙස්පුටු වල ආලේප කිරීමට අවශ්‍ය පින්තාරු ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 91480.00 |
| | 97 | එස්.එම්.කේ.බී.සමරකෝන් මයා. | රඹුක්කන ප්‍රාදේශීය සභා පෙරපාසැලේ ඩෙස්පුටු,ඇතුළත හා පිටල බිත්ති හා ක්‍රීඩා උපකරණ වල ආලේප කිරීම සඳහා තීන්ත ඇතුළු පින්තාරු ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 86200.00 |
| | 98 | සුපුන් ට්‍රේඩ් සෙන්ටර් | රඹුක්කන ප්‍රාදේශීය සභා මාර්ග අංශයට අයත් තනකොළ කපන යන්ත්‍ර 03ක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4545.00 |
| | 99 | වී.ආර්.ටී.ආර්.බණ්ඩාර අලහකෝන් මයා. | දර ප්‍රවාහනයට අවසර ලබා ගැනීම සඳහා තැනපත් කළ ඇප මුදල් ආපසු ගෙවීම. | 25000.00 |
| | 100 | ටී.එම්.ජී.බී.තෙන්නකෝන් මයා. | 2022.12.18 දින ප්‍රජා ශාලාව වෙන් කිරීමේ මුදල ආපසු ගෙවීම. | 2000.00 |
| 2023.01.30 | 101 | ආදායම් ගණකාධිකාරී,ලං.වි.ම | 2023 ජනවාරි මාසයට අදාලව සතිපොළ වෙලඳ භූමියේ විදුලි බිල්පත් ගෙවීම. | 369.24 |
| | 102 | තරිඳු මෝටර්ස් | සභාව සතු SG.RE-2261 අංක දරණ 350 DI ස්ටෑන්ඩර්ඩ් ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියාවක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 44500.00 |
| | 103 | එම්.ආර්.සී.යූ.බණ්ඩාර මයා. | සභාව සතු SG.RE-2261 අංක දරණ 350DI ස්ටෑන්ඩර්ඩ් ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියාවක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 1000.00 |
| | 104 | *Sri Lanka Insurance coroporation (Pvt)Ltd* | | 22149.21 |
| | 105 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | දුරකථන බිල්පත් ගෙවීම. | 12161.13 |
| | 106 | එම්.ආර්.සී.යූ.බණ්ඩාර මයා. | සභාව සතු WP.RW-9023 අංක දරණ විමල් ට්‍රැක්ටර් ට්‍රේලරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1000.00 |
| | 107 | Britex Safety House | රඹුක්කන ප්‍රා.ස අයත් සභාදේපළ වල ගිනි නිවන උපකරණ 2023/2024 වර්ෂ සඳහා අලුත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 67200.00 |
| | 108 | ආර්.එස්.එස්.කේ.රාජපක්ෂ මිය. | අධ්‍යාපන ආධාර | 2000.00 |
| | 109 | පී.ජී.එල්.සී.කුමාර මයා. | සභාව සතු SG.PF-7429 අංක දරණ ඩබල් කැබ් රථයේ අලුත්වැඩියාවක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 900.00 |
| | 110 | ජාතික ජල සම්පාධන හා ජලාපවාහන මණ්ඩලය. | ඉඹුල්ගස්දෙණිය පුස්තකාලයේ ජල බිල්පත් සඳහා මුදල් ගෙවීම. | 1959.60 |
| | 111 | ජාතික ජල සම්පාධන හා ජලාපවාහන මණ්ඩලය. | 2022 දෙසැම්බර් මස ජල බිල්පත් ගෙවීම. | 18266.22 |
| | 112 | ජාතික ජල සම්පාධන හා ජලාපවාහන මණ්ඩලය. | 2023 ජනවාරි මාසය සඳහා ජල බිල්පත් ගෙවීම. | 59593.33 |

| | | | | |
|---|---|---|---|---|
| | 113 | ලේකම් | සෞඛ්‍ය අංශයේ පරිහරණය සඳහා අවශ්‍ය වෙවැල් කූඩ මිලදී ගැනීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 20000.00 |
| | 114 | ජී.ජී.ලක්මාලි මිය | රඹුක්කන පුස්තකාලයේ වාර්ෂිකව මිලදී ගත් පොත් වල අඩුපාඩු සහිත පොත් මාරු කර නැවත ගෙන්වා ගැනීමේ ප්‍රවාහන වියදම් වන රු.620ක මුදල පෞද්ගලිකව වියදම් කළ බැවින් එය ලබා දීම. | 620.00 |
| | 115 | මුදල් භාරකරු | රඹුක්කන ප්‍රා.ස සංග්‍රහ කටයුතු සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබා ගැනීමට ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම. | 20000.00 |
| | 116 | ආර්.එම්.පී.රත්නායක මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 2824.00 |
| | 117 | ආර්.එම්.පී.රත්නායක මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 3444.00 |
| | 118 | ජී.එච්.අටුළුගම මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 3248.00 |
| | 119 | ඩබ්.ඒ.එන්.කේ.වර්ණසූරිය මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 2224.00 |
| | 120 | තිළිණි නිරෝෂනී මිය | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 4900.00 |
| | 121 | පී.ජී.ඩී.විජයන්ති මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 2336.00 |
| | 122 | ඩබ්.ඩී.සංජීව මයා. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 5000.00 |
| | 123 | එස්.එන්.නාන්ද ශ්‍රී | ගමන් වියදම් - ජනවාරි මාසය. | 350.00 |
| | 124 | Registar General | 2022 සැප්තැම්බර් මාසයේ මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීම වෙනුවෙන් සේවා ගාස්තු ගෙවීම. | 18200.00 |
| | 125 | එස්.පී.පී.ප්‍රියමාලි ඥානරත්න මිය. | නව පළමු වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ අංක 14 කඩ කාමරයට යාබද හිස් ඉඩකඩ ටෙන්ඩර් කිරීමට ලංසු ඉදිරිපත් කිරීමට තැන්පත් කළ ටෙන්ඩර් ඇප ආපසු ගෙවීම. | 10000.00 |
| | 126 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 10000.00 |
| | 127 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් | 4000.00 |
| | 128 | එම්.එන්.එෆ්.පිරස්මිනා මිය. | 2022.12.26 දින , 27 දින ප්‍රජාශාලාව වෙන් කිරීමේ ඇප තැන්පතු ආපසු ගෙවීම. | 1710.00 |
| | 129 | පී.වී.ඩී.ආර්.පහළවිතාන මයා. | 2023.01.22 දින බකබුරය ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප තැන්පත් ගෙවීම. | 1000.00 |
| | 130 | අආධායම් ගණකාධිකාරී- ලංකා විදුලිබල මණ්ඩලය | 2022 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාල විදුලි බිල්පත් ගෙවීම. | 74767.64 |
| | 131 | ආධායම් ගණකාධිකාරී- ලංකා විදුලිබල මණ්ඩලය | 2023 ජනවාරි මාසයට අදාල විදුලි බිල්පත් මුදල් ගෙවීම. | 29081.04 |
| | 132 | ලේකම් | රඹුක්කන ප්‍රා.ස කමිටු රැස්වීම සහ වෙනත් සංග්‍රහ කටයුතු සඳහා ද්‍රව්‍ය ලබා ගැනීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 10000.00 |
| | 133 | වී.එම්.එන්.දිල්හානි මිය. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 1750.00 |
| | 134 | ඩබ්.ඩී.එස්.කුමාර මයා. | ගමන් වියදම් - ජනවාරි මාසය. | 2386.00 |
| | 135 | Post Master Genaral | තැපැල් මුද්දර වටිනාකම අලුත්කිරීම. | 30000.00 |
| 2023.01.31 | 136 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් | 20000.00 |

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

2023.01.09 සිට 2023.01.31 දක්වා උපලේඛන අංක 01හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

ඉ.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා

ගරු හිටපු උප සභාපති ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමාගේ හෘදයාබාධයක් නිසා හදිසියේ මියගිය බවත් ඒ සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, උප සභාපති, මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයේ බලවත් ශෝකය බිරිඳ ඇතුළු පවුලේ සියලුදෙනා වෙත දන්වා යැවීමට යෝජනා කරමි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ආර්.ටී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා

උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් රඹුක්කන ප්‍රාදේශීය සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයෙක් බවත් හිටපු උප සභාපති ධුරයද දැරූ අතර තම මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් උදාර සේවයක් කළ මන්ත්‍රීවරයෙක් බව ගරු පියරත්න මැතිතුමන් විසින් පවසන ලදි. එතුමා ආගමට ලැදි පුද්ගලයෙක් වන අතර ක්‍රිස්තියානි ආගමේ වාර්ෂිකව පවත්වන නත්තල් උත්සවය වැනි උත්සව සඳහා උනන්දුවෙන් කටයුතු කල ආකාරයක් දක්නට ලැබුණු බවත් සභාව තුළදී සුහදව කටයුතු කළ බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පැවසූ අතර එතුමාට නිවන් සුව ලැබේවායයි ප්‍රාර්ථනා කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංජිත් ටිකිරි බණ්ඩාර මැතිතුමා

උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා අප ප්‍රාදේශීය සභාව තුළ දීර්ඝ කාලයක් අප සමඟ සිටි මන්ත්‍රීවරයෙක් වන අතර රඹුක්කන ජනතාව වෙනුවෙන් විශාල දායකත්වයක් ලබාදුන් බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි.සමාජයට ආගම දහමට ලැදි පුද්ගලයෙක් ලෙස එතුමන්ව අගය කළ හැකි අතර හේවාදිවෙල ප්‍රදේශයට විශාල සේවයක් ඉටු කර ඇති බව ඒ ප්‍රදේශයේ ජනතාව විසින් පවසන කරුණු අනුව පැහැදිලි වන බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.මෙතුමාගේ අභාවය රඹුක්කන කොට්ඨාසයටම විශාල පාඩුවක් බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි.ගරු සභාපතිතුමා විසින් එතුමාගේ අවසන් කටයුතු කරන අවස්ථාවේදි ඒ වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දුන් බව එතුමන් විසින් පවසන ලදි. සභාව විසින් මහජන නියෝජිතයන් වෙනුවෙන් උපහාර උළෙලක් පවත්වන අවස්ථාවක උදය ප්‍රසාද් තිලකරත්න මන්ත්‍රීතුමාට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසද පවසන ලදි.නිදහස් අදහස් දැක්වීම මෙන්ම අසාධාරණය අයුක්තිය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකු බවත් එතුමාගේ අකාලික මරණය සම්බන්ධව ශෝකයට පත්වන බවත් එතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමා

උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ මෙන්ම වර්තමාන සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙසද කටයුතු කළ අතර රඹුක්කන ප්‍රදේශයට විශාල සේවයක් ඉටුකර ඇති බවද එතුමා ශ්‍රීලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලන ජීවිතය ආරම්භ කළ බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.එසේ හේවාදිවෙල ප්‍රදේශයට විශාල වැඩ කොටසක් සිදු කළ ජනතා නායකයෙක් වශයෙන්ද එතුමා හැදින්විය හැකි බවද ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.ඉතාම සුහදශීලීව මෙන්ම ලෙන්ගතුව කටයුතු කළ බවත් ඍජු තීරණ ගැනීමට යොමු වූ නායකයෙක් ලෙස කටයුතු කළ බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි. එතුමාගේ හදිසි අභාවය හේතුවෙන් ශෝකය ප්‍රකාශ කර එතුමාගේ පවුලේ ඥාතීන් වෙත දන්වා යැවීම සුදුසු බව ගරු රණවීර මැතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා

දීර්ඝ කාලයක සිට වාමාංශික දේශපාලන නායකයෙක් වශයෙන් කටයුතු කළ ගරු උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධයෙන් ශෝකයට පත්වන බව ගරු මැතිතුමන් විසින් පවසන ලදි.තම හේවාදිවෙල ප්‍රදේශයට පමණක් නොව රඹුක්කන මැතිවරණ කොට්ඨාසයට විශාල සේවයක් ඉටු කළ මන්ත්‍රීවරයෙක් ලෙස එතුමන්ව හැඳින්විය හැකි අතර සභාවේ ගැටළුකාරී අවස්ථාවලදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගරු තිලකරත්න මැතිතුමා කටයුතු කර ඇති බවත් ආගමික සහජීවනය ඇති කිරීම සඳහා කටයුතු කළ බවත් ගරු ශ්‍රීලාල් මැතිතුමා විසින් පවසන ලදි. එතුමාගේ හදිසි මරණය පිළිබඳව ශෝකයට පත්වන අතර පළාත් පාලන ආයතනයක් ලෙස එතුමාගේ අවසන් කටයුතු සඳහා උපරිම සහයෝගය දැක්වූ බවත් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර එතුමාගේ පවුලේ ඥාතීන් වෙත ශෝකය ප්‍රකාශ කර ලිපියක් යොමු කිරීම සුදුසු බවත් ගරු උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමාට කරන ගෞරවයක් ලෙස එතුමා නමින් මාර්ගයක් නම් කිරීම සුදුසු බව ගරු ශ්‍රීලාල් මැතිතුමා විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. එස්. රණසිංහ මැතිතුමා

ගරු උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමාගේ අභාවය සම්බන්ධව ශෝකයට පත්වන අතර එතුමා රඹුක්කන ප්‍රදේශයට සිටි ප්‍රසිද්ධ කීර්තිමත් පාලකයෙක් මෙන්ම හිත හොඳ නිහතමානී මනුස්සයෙක් වන බවත් ගරු රණසිංහ මැතිතුමා විසින් පවසන ලදි.සභාව තුළදි පමණක් නොව ගම තුළ කටයුතු කිරීමේදිද ජනතාව සමඟ සුහදශීලීව කටයුතු කළ මන්ත්‍රීවරයෙක් ලෙස එතුමන්ව හැඳින්විය හැකි බවත් එතුමාගේ හදිසි අභාවය සම්බන්ධව ශෝකයට පත්වන බව දක්වමින් ගරු රණසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ආර්.කේ රත්නායක මැතිතුමිය

ගරු උදය තිලකරත්න මැතිතුමාගේ හදිසි වියෝව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෙස ඉතාම කණගාටුවන බවත් ගරු මැතිතුමිය විසින් පවසන ලදි.එතුමාගේ අභාවය සිදු වූ අවස්ථාවේ සිට අවසන් කටයුතු දක්වාම සභාපතිතුමා ඇතුළු රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් ලබාදුන් සහයෝගයට ස්තුතිය පුදකරන අතර එතුමාගේ ඥාතීන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර ලිපියක් ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.බන්දු ප්‍රියංකර වීරසිංහ මැතිතුමා

ගරු උදය තිලකරත්න මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝක වන බවත් කුඩා අවධියේ සිටම මිත්‍රයෙකු ලෙස ඇසුරු කළ බවත් පරාර්ථකාමී අදහස් හැඟීම් ඇති පුද්ගලයෙක් වන බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි.එතුමා වැරදි ලෙස දේශපාලනය නොකල අතර හේවාදිවෙල ප්‍රදේශයට පමණක් නොව රඹුක්කන කොට්ඨාසයටම විශාල සේවයක් ඉටු කල බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි. 2006 වර්ෂයේදී දේශපාලන ගමන ආරම්භ කළ එතුමා වසර 17 පමණ කාලයක් මෙම සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කළ බවත් ගරු වීරසිංහ මැතිතුමන් විසින් පැවසූ අතර එතුමාට නිවන් සුව ලැබේවායයි ප්‍රාර්ථනා කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

ගිය මස සභා වාරයේදි මාගේ වම් පසින් සිටි ගරු උදය තිලකරත්න මැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධව ශෝක වන බවත් ගරු තිලකරත්න මැතිතුමා බොහෝම සුන්දර මනුස්සයෙක් බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි.මෙම සභාවේ උප සභාපති ධූරයද දැරූ එතුමා පිළිබඳව ගුණ අනුස්මරණය කිරීම වැදගත් වන අතර එතුමා තුළ පැවති නමාශීලීභාවය,සුහදත්වය අගය කළ යුතු බවත් එතුමාගේ දේශපාලන ජීවිතය ආදර්ශයට ගත යුතු බවත් ගරු වික්‍රමසිංහ මන්ත්‍රීතුමා විසින් පවසන ලදි.ගරු ශ්‍රීලාල් මැතිතුමාගේ යෝජනාවට අනුව එතුමා ජීවත්ව සිටි හේවාදිවෙල ප්‍රදේශයේ ඇති මාර්ගයක් එතුමා නමින් නම් කිරීම සුදුසු වන බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි. අපගේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාගේ ඥාතීන් වෙත දන්වා යැවීම සුදුසු බවත් ගරු මැතිතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා**

ගරු උදය තිලකරත්න මැතිතුමාගේ ගුණ අනුස්මරණය කිරීම සඳහා ගරු රුක්මන් පියරත්න මැතිතුමා විසින් ගෙනා යෝජනාව ඉතාම වැදගත් බවත් 2006 වර්ෂයේ සිට ඉතාම සමීපව ආශ්‍රය කල බවත් ගරු උප සභාපතිතුමන් විසින් පවසන ලදි.එතුමා බොහෝම විනෝදකාමී පුද්ගලයෙක් එතුමාගේ හදිසි අභාවය සම්බන්ධව ශෝකයට පත්වන බවත් පවුලේ ඥාතීන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර දන්වා යැවීම සුදුසු බවත් අභාවයෙන් පසු කෙමස්පූර්ණය වෙනුවෙන් පවත්වන යම් දානමය පින්කමක් ඇති නම් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සුදුසු බවත් ගරු උප සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති අතුල හදගම මැතිතුමා**

ගරු උදය තිලකරත්න මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් සියලුදෙනාම ශෝකයට පත්වන අතර 2006 වර්ෂයේ මැතිවරණයෙන් ජයග්‍රහනය කර සභාවට තේරීපත්වූ මෙතුමා මියයන මොහොත දක්වාම සභාවේ මන්ත්‍රිවරයෙකු ලෙස රැදී සිටි අතර සියලුදෙනා සමඟ මිතුරෙකු ලෙස සමගියෙන් කටයුතු කළ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.නීතිගරුකව මෙන්ම විනයගරුකව මේ පළාත් පාලන ආයතනයේ ජනතාව වෙනුවෙන් සේවය කළ එතුමා වාදවිවාද මතවාද ඇති වුණත් මෙම සභාවෙන් පිටතදි ගැටුමක් ඇති නොවූ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.එතුමා යථාර්ථවාදය තේරුම්ගත් දේශපාලකයෙක් ලෙස ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් සිදු කළ බවත් එතුමා ආදර්ශමත් චරිතයක් බවත් ගරු සභාපතිතුමා විසින් පැවසූ අතර හේවාදිවෙල ප්‍රදේශයට පමණක් නොව රඹුක්කන කොට්ඨාසයටම එතුමා නොමැති අඩුව දැනෙනා බවත් පැවසුහ.මෙම සභා ධූර කාලය අවසන් වන තුරු හෝ එතුමා අප සමඟ සිටියානම් සතුටුවන බවත් එතුමාගේ පවුල වෙත ශෝකය ප්‍රකාශ කර දන්වා යැවීමට කටයුතු කරන බවත් එතුමා පතන ස්වර්ග මෝක්ෂ සැප ලැබේවායයි ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමන් සිය කතාව අවසන් කරන ලදි.

## ඉ).II.යථා පරිදි කල්දී නොමැති යෝජනා

## ඉ).II.01

❖ **ගරු සභාපති අතුල හදගම මැතිතුමා**

රඹුක්කන බණ්ඩාරනායක ප්‍රජා ශාලා පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර ඒ වෙනුවට නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තයේ පරිපාලන අත්තිකාරම් මුදල් වශයෙන් (රු.300,000.00) ලබාගැනීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, ඉංජිනේරු සේවා, රත්නපුර විසින් එවා ඇති ලිපිය හා වවුචරය ඉදිරිපත් කර ඇති අතර එම ගෙවීම සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති අතුල හදගම මැතිතුමා**

නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සැළසුම් සකස් කලේ ඉංජිනේරු සේවා ආයතනයෙන් වන බවත් එම පරිපාලන කටයුතු සඳහා වියදම් දැරීම සඳහා (රු.300,000.00) මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් මේ සඳහා ස්ථාවර තැන්පතු මුදල යොදා ගැනීමට බලාපොරොත්තු වන අතර දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබාගැනීම සඳහා ආණ්ඩුකාර අනුමැතියට යොමු කර ඇති බවත් අනුමැතිය ලැබුණු පසු ටෙන්ඩර් කිරීමේ හැකියාව ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ඉංජිනේරු සේවා ආයතනය වෙත රු.300,000.00 මුදල ගෙවීමට තීරණය විය.

## ඉ).II.02

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ආදොළුව,රඹුක්කන ලිපිනයෙහි පදිංචි ජේ.පී.අනුර රංජිත් කුමාර මහතා විසින් නව වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ අංක 01 කඩ කාමරයට යාබදව කරප්පු පෙළ යට ඇති හිස් ඉඩ ප්‍රමාණය බද්දු පදනම මත ලබාගැනීම සඳහා ඉල්ලීමක් කර ඇති අතර මෙම ඉඩ කොටස වර්ග අඩි 110ත් යුක්ත වන බවත් වාර්ෂික කුලී පදනම මත රු.30000.00ක මුදලකට ලබාදීම සුදුසු බවත් ඉදිරි වර්ෂයන්වලදී ටෙන්ඩර් ක්‍රියාවලියට යාම සුදුසු බවත් ආදායම් පරීක්ෂක විසින් දන්වා ඇති බවත් වාර්ෂික කුලී පදනම මත රු.30000.00 මුදලකට ලබාදීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

වාර්ෂික කුලී පදනම මත රු.30000.00 මුදලකට ලබාදීමට තීරණය විය.

## ඉ).II.03

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වාර්තාව මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර එය පිළිගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

මූල්‍ය ප්‍රකාශන වාර්තාව අනුමත කිරීමට තීරණය විය.

## ඉ).II.04

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මැදගොඩැල්ල විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් දැනට ඉදිකරමින් පවතින බෝධි ප්‍රාකාර බැම්මේ අවශ්‍යතාවයක් වෙනුවෙන් ගසක් අවශ්‍ය වී ඇති බවත් ඒ සඳහා ප්‍රාදේශීය සභාවට අයත් මුංකොටුව පොදු සුසාන භූමියේ ඇති ලුණුමිදෙල්ල ගස ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර එම ගස ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අය කිරීමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.05

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

නව පළමු වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ අංක 05 කඩ කාමරය 2017.09.25 දින රු.1,050,500.00 ක කීමනි මුදලක් ගෙවා එස්.එම්.පස්මිල් මහතා විසින් ලබා ගෙන ඇත. නමුත් වර්ෂා කාලයට කඩ කාමරය තෙමෙන බැවින් මේ වන තෙක් ව්‍යාපාර කටයුතු සිදු නොකල බවත් පසුව තමන් විසින්ම පිළිසකර කර ගෙන ඇත.මේවන තෙක් කඩ කුලීය ගෙවීමක් සිදු නොකළ අතර 2023 පෙබරවාරි මස සිට කඩ කුලීය අය කරගන්නා ලෙසත් ගෙවා නොමැති බදු මුදල හා දඩ කුලීය අයකර නොගන්නා ලෙස ඉල්ලීමක් සිදු කර ඇත.මෙම කඩ කාමරය සඳහා වන දඩ මුදල රු.311,610.00 වන බවත් එම දඩ මුදල පමණක් ඉවත් කර බදු මුදල අය කරගැනිම සුදුසු බව ආදායම් පරීක්ෂක විසින්ද දක්වා ඇත. දඩ මුදල ඉවත් කර බදු මුදල අය කරගැනිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ද යි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**දඩ මුදල ඉවත් කර බදු මුදල අය කරගැනිමට තීරණය විය.**

## ඉ).II.06

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

දැලිවල තිස්ස විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ තණ කොළ කපා ඉවත් කරගැනිම සඳහා විදුහල්පතිතුමා විසින් සභාව සතු බැකෝ යන්ත්‍රය ලබාගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා බැකෝ යන්ත්‍රය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**බැකෝ යන්ත්‍රය ගාස්තු අය කිරිමකින් තොරව ලබාදීමට තීරණය විය.**

## ඉ).II.07

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

නො 151,ඉහළ ඇත්වටේවත්ත,කිරිවල්ලාපිටිය පදිංචි එස්.එන්.එන්.සඳමාලි මිය විසින් සභාවට අයත් විජයමාන්නාහේන ආදාහනාගාරය අසල දකුණු පස ඉඩමේ ඉලුක් වැවී ඇති අතර හිස් ඉඩමේ කෙටිකාලීන බෝගවන මඤ්ඤොක්කා,මෑ බටු,මිරිස්,වැනි බෝග වගා කිරිම සඳහා අවසර ඉල්ලා ඇති අතර කෙටිකාලීන බෝග වගා කිරිම සඳහා ගිවිසුමක් මඟින් එම ඉඩම ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**කෙටිකාලීන බෝග වගා කිරිම සඳහා ගිවිසුමක් මඟින් එම ඉඩම ලබාදීමට තීරණය විය.**

## ඉ).II.08

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

ගොඩගංදෙණිය පදිංචි එම්.බී.එම්.ලසන්ති කස්තුරිආරච්චි මෙනවිය පෙරපාසල් ඩිප්ලෝමාවක් හදාරා ඇති බවත් ඒ සඳහා වන මාස 06 ක පුහුණුව සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසලේ අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇති අතර ඒ සඳහා අවස්ථාව ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

පුහුණුව සඳහා අවස්ථාව සලසාදීමට තීරණය විය.

## ඉ).II.09

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

කරඳලස්තැන්න, හිරිවඩුන්න ලිපිනයෙහි පදිංචි එච්.පී.ජී.අයි.එච් පතිරණ මෙනවිය පෙරපාසල් ඩිප්ලෝමාවක් හදාරා ඇති බවත් ඒ සඳහා වන මාස 06 ක පුහුණුව සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසලේ අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇති අතර ඒ සඳහා අවස්ථාව ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

පුහුණුව සඳහා අවස්ථාව සලසාදීමට තීරණය විය.

## ඉ).II.10

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

සමන්තාගම ගම්වාසීන් පිරිසක් විසින් සමන්තාගම පිහිටා ඇති රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ප්‍රජා ශාලාව තුළ පෙරපාසලක් පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා ඇති අතර පෙරපාසල පවත්වාගෙන යාමට අවසර ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

සමන්තාගම ප්‍රජා ශාලාවේ පෙරපාසල පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදුන්නද ඒ සඳහා ගාස්තුවක් අයකර ගන්නේද යන්න ගරු සභාපතිතුමන් විසින් විමසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමා**

මෙම සමන්තාගම ප්‍රජා ශාලාව සභාව සතු දේපලක් වන නිසා තීන්ත ආලේප කිරීම වැනි නඩත්තු කටයුතු සිදු කිරීමට ඇති බැවින් මුදලක් ලබාගැනීම සුදුසු බවත් පෙරපාසල නොමිලේ පවත්වාගෙන යනවා නම් ගාස්තුවක් අය නොකර සිටීම සුදුසු බවත් පෙරපාසල් ළමුන්ගෙන් මුදල් අයකර ගැනීමක් සිදු කරන්නේ නම් සභාවට ගාස්තුවක් අයකරගැනීම සුදුසු බවත් ගරු සිරිසේන මැතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මෙම පෙරපාසල පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදී සුදුසු බවත් පසුව ප්‍රජා සංවර්ධන නිලධාරි මගින් වාර්තාවක් ලබාගෙන එම වාර්තා සලකා බලා ගාස්තුවක් අයකිරීම සඳහා මහ සභාවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

පෙරපාසල පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදීමටත් පසුව ප්‍රජා සංවර්ධන නිලධාරි මගින් වාර්තාවක් ලබාගෙන එම වාර්තා සලකා බලා ගාස්තු අයකිරීම සඳහා නැවත මහ සභාවට යොමු කිරීමටත් තීරණය විය.

# ඉ).II.11

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ සේවය කරන ඩබ්.රශානි සමන් කුමාරි මිය හට ගණේමුල්ල සිට රැකියා ස්ථානයට ආසන්නම දුම්රියපොලවන පොල්ගහවෙල වෙත පැමිණීමට මාස තුනක් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාගැනීම සඳහා ගාස්තුව වශයෙන් රු.11,100.00 මුදල එම ප්‍රවේශ පත්‍රය ලබාගැනීම සඳහා ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අදාළ ගෙවීම් කිරීමට තීරණය විය.

# ඉ).II.12

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලව විසින් පවත්වනු ලබන අලෙවි ප්‍රදර්ශනයක් සඳහා 2023/03/27,28,29,30 යන දිනයන්හි රඹුක්කන ප්‍රජා ශාලාව නොමිලේ ලබාගැනීම සඳහා ඉල්ලීමක් සිදුකර ඇති අතර ප්‍රජා ශාලාව නොමිලේ ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ගාස්තු අය කිරීමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.13

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වනු ලබන අලෙවි ප්‍රදර්ශනයක් සඳහා ප්‍රාදේශීය සභාව ඉදිරිපිට ඇති ප්‍රධාන මාර්ගය වම්පස කොටස සෑම මාසයකම 25 දිනට පසුව එලඹෙන සඳුදා දිනය තුළ ලබාගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත. ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව මාර්ගය අවහිර නොවන ආකාරයෙන් ලබාදීම සුදුසු බව දන්වා ඇති අතර මාර්ගය අවහිර නොවන ආකාරයෙන් ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පි.කේ.රණවීර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අලෙවි ප්‍රදර්ශනය සඳහා මාර්ගය අවහිර නොවන අයුරින් ලබාදීමට තීරණය විය.

## ඉ).II.14

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

හෙරිටේජ් ගාර්ඩන් නැමති ඉඩම ඇක්සස් රියල් නැමති සමාගම මගින් කොටස්කර විකිණීමේදි 10% පොදු ඉඩම් කොටසක් ලෙස රඹුක්කන ප්‍රාදේශීය සභාව වෙත පවරා දි ඇති අතර එහි පොල් ගස් 12ක් පමණ ඇති බවත් දක්වා ඇත. පිටවෙල පාර,හිරිවඩුන්න ලිපිනයෙහි පදිංචි ඩබ්.ඒ.එස්.ඒ බණ්ඩාර මහතා විසින් රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් හෙරිටේජ් ගාඩ්න් නැමති ඉඩමේ පොල් එලදාව සඳහා මෙන්ම සුළු බෝග වගාවක් සිදු කරගැනිම සඳහා 2023 වර්ෂය සඳහා බදු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර රු.2300.00 මුදලකට මෙම වර්ෂයේ ඉදිරි මාස සඳහා ලබාදීමට හැකි බව ආදායම් පරීක්ෂක විසින් වාර්තාවක් ලබාදි ඇත.ඒ අනුව ඩබ්.ඒ.එස්.ඒ බණ්ඩාර මහතා හට එම ඉඩම මෙම වර්ෂය සඳහා බදු ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

මෙම ඉඩම සඳහා ඔප්පු මෑත කාලයේ හිමි වු නිසා එලදා බදු ලේඛනයට මෙම ඉඩම ඇතුලත් කර නොමැති බවත් මෙම වසරේදි බදු ලබාදීම සුදුසු බවත් ලබන වර්ෂයේ සිට ටෙන්ඩර් ක්‍රියාවලියට යොමු කරන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

2023 වර්ෂය සඳහා බදු ලබාදීමටත් ලබන වර්ෂයේ සිට ටෙන්ඩර් ක්‍රියාවලියට යොමු කිරිමටත් තීරණය විය.

## ඉ).II.15

❖ ගරු සභාපති අතුල හදගම මැතිතුමා

රඹුක්කන සතිපොළ අංක 119 කඩ කාමරය එම්.එච්.එම්.අන්වර් මහතාට අයිතිය ඇති බවත් මේවන විට ඔහු මිය ගොස් ඇති බැවින් ඔහුගේ පුතාවන එම්.ඒ.එච්.නජිබ්දින් මහතා හට පවරාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අයිතිය පවරාදීමට තීරණය විය.

## ඉ).II.16

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කෑ/මාව පුවක්මොටේ මහ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සුද්ද කරගැනිම සඳහා සභාව සතු යන්ත්‍රෝපකරණයක් ලබා දෙන ලෙස එම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉල්ලීමක් කර ඇති අතර එය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

බැකෝ යන්ත්‍රය ගෙවීමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.17

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

දැලිවල ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන අවුරුදු පොළක් සඳහා 2023.04.11 දින ප්‍රජා ශාලාව හා භූමිය නොමිලේ ලබාගැනිමට ඉල්ලීමක් කර ඇති අතර එය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ප්‍රජා ශාලාව ගාස්තු අය කිරිමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.18

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

දැලිවල ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන කාන්තා එල්ලේ තරඟාවලියක් සඳහා 2023.03.10 දින රඹුක්කන අශෝක ක්‍රීඩාංගනය නොමිලේ ලබාගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත.එම ක්‍රීඩාංගනය නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කර ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අශෝක ක්‍රීඩාංගනය ගාස්තු අය කිරිමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.19

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කෑ/මාව පින්නවල මධ්‍යම මහා විද්‍යාලයේ ක්‍රීඩා කරඟ සඳහා බතඹුරය ක්‍රීඩාංගණය නොමිලේ ලබාගැනිමට ඉල්ලීමක් කර ඇති අතර බතඹුරය ක්‍රීඩාංගණය නොමිලේ ලබාදිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

බතඹුරය ක්‍රීඩාංගණය ගාස්තු අය කිරිමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.20

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

එම්.ජී.කේ.ජයසූරිය මහතා විසින් 2023.02.25 දින බතඹුරය ක්‍රීඩාංගනයේ පවත්වනු ලබන සංගීත ප්‍රසංගයට අමතරව තාවකාලික බියර් ස්ටෝල් එකක් පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා ඇති අතර ඒ සඳහා අවසර ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එල්. නලින් බුද්ධික ජයසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එල්. නලින් බුද්ධික ජයසූරිය මැතිතුමා

මෙම කාර්යය Lion Brewery (Ceylon)plc ආයතනය හරහාම සිදුවන වන බැවින් විරුද්ධවීම අවශ්‍ය නොවන බව ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සිරිසේන මැතිතුමා

මෙම ස්ථානයේ අධ්‍යාපනය සම්බන්ධ කටයුත්තක සිදුවන බැවින් බියර් ස්ටෝල් එකක් දැමීම වැනි කාර්යයක් සඳහා අවසර දීම සුදුසු නොවන බව ගරු සිරිසේන මැතිතුමන් විසින් පවසන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

බියර් ස්ටෝල් එකක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදිය හැක්කේ ඒ සඳහා අවසර තිබෙන අයෙකුට පමණක් බවත් බලපත්‍ර නොමැතිව විවෘත ස්ථානයකට යාමට නොහැකි බවත් ගරු වික්‍රමසිරි මැතිතුමන් ප්‍රකාශ කරන ලදී.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

Lion Brewery (Ceylon) plc ආයතනය විසින් ඉල්ලා සිටින බැවින් විරුද්ධත්වයක් දැක්විය නොහැකි බවත් යම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ සඳහා වගකීම සංවිධායක මණ්ඩලය විසින් බාරගත යුතු බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

බියර් ස්ටෝල් එක පවත්වාගෙන යාමට අවසර ලබාදීමට තීරණය විය.

## ඉ).II.21

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඉඩම් හිමිකරු ලබාදි ඇති ලේඛන හා ආදායම් පරීක්ෂක එන්.ඩී.එල්.උපුල් කුමාර මහතාගේ වාර්තාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කෙහෙල්වතුගොඩ ග්‍රාම නිලධාරී වසමේ පදිංචිව සිටි එච්.ආර්. ඩිංගිරි බංඩා මහතාට අයත් කොකටියදෙණිය නැමති ඉඩම ඔහුගේ නමින් අක්කර බදු ලේඛනයේ ඇතුළත් කොට මේ දක්වා අක්කර බදු ගෙවා ඇත.පසුව මෙම ඉඩම කොටස් කර පුද්ගලයන් දෙදෙනෙකුට පවරා ඇති අතර ඊට අදාල ඔප්පු හා පිඹුර අනුව මෙම ඉඩම අක්කර බදු ගෙවීමට අදාල ඉඩම් ප්‍රමාණයට ප්‍රමාණවත් නොවන බව අනාවරණය වී ඇත.ඒ බව ග්‍රාම නිලධාරිවරයාද සහතික කර ඇති අතර එබැවින් මෙම ඉඩම සඳහා අක්කර බදු ගෙවීම නිදහස් කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අක්කර බදු ලේඛනයෙන් නම ඉවත් කිරීමට තීරණය විය.

## ඉ).II.22

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ (මහකණුව,අළුදෙණියවත්ත,නිකගොල්ලවත්ත) යන මාර්ගවල කාණු පද්ධතිය පිරිසිදු කිරිම හා පැති කාණු පද්ධති අලුතින් දැමීම සඳහා වැයවීමට අපේක්ෂිත මුදල රු.300,000.00වන අතර එම ඇස්තමේන්තු මුදල අනුමත කිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.පී.එස්.පී.කේ.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

රු.300,000.00 මුදල අනුමත කිරිමට තීරණය විය.

## ඉ).II.23

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුල ගොඩගැසි ඇති පොලිතින් පුත්තලම හොල්සීම් ආයතනය වෙත රැගෙනයාම වෙනුවෙන් දින දෙකක් සඳහා රු.116,000.00 වැයවන අතර එම ඇස්තමේන්තු මුදල ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යොජනා කළ අතර ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

රු.116,000.00 මුදල අනුමත කිරිමට තීරණය විය.

## ඉ).II.24

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

තල්දැව ශ්‍රී බෙත්තාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් එම විහාර භූමිය සුද්ද කරගැනිම සඳහා බැකෝ යන්ත්‍රය ලබාගැනිමට ඉල්ලිමක් කර ඇති අතර ඒ සඳහා බැකෝ යන්ත්‍රය ලබාදිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ගාස්තු අය කිරිමකින් තොරව ලබාදීමට තීරණය විය.

## ඉ).II.25

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

තල්දැව ශ්‍රී බෙත්කාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් 2023.03.13 දින එම විහාරස්ථානයේ ධර්මදේශනා වැඩ සටහනක් සඳහා ප්‍රාදේශීය සභාව සතු සන අපද්‍රව්‍ය කළමනාකරන ව්‍යාපෘතිය තුළින් විහාරස්ථානයට තාවකාලිකව විදුලිය ලබාගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත.එම කටයුත්ත සඳහා විදුලිය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

තාවකාලිකව විදුලිය ලබාදීමට තීරණය විය.

## ඉ).II.26

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

බී.එන්.කේ ගමගේ මිය 2023,2024 වර්ෂ සඳහා අක්කර බදු ලේඛන ලිවීම සඳහා දීමනා වශයෙන් එක් ඒකකයක් ලිවීම සඳහා රු.2.00 බැගින් ඒකක 779 සඳහා රු.1558.00 මුදලක් ලබාගැනිම සඳහා ඉල්ලීම කර ඇති අතර එය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

දීමනාව ලබාදීමට තීරණය විය.

## ඉ).II.27

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

උඩුගම පත්තම්පිටිය පදිංචි එච්.ආර්.රංජිත් බණ්ඩාර මහතා විසින් උඩුගම සේරුමැඩිල්ලවත්ත මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන ගල් පස් යොදා සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර මේ සඳහා මැතිවරණ කාලසීමාව තුළ එම කටයුතු සඳහා මුදල් වෙන් කළ නොහැකි අතර ඒ සඳහා වන ඇස්තමේන්තුව සකස් කිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

මැතිවරණ කාලසීමාව තුළ එම කටයුතු සඳහා මුදල් වෙන් කළ නොහැකි බැවින් ඒ සඳහා ඇස්තමේන්තුව සකස් කිරිමට තීරණය විය.

## ඉ).II.28

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කටුපඳුර හේවාදිවෙල පදිංචි දිස්නා වසන්ති ගුණරත්න මිය දරුණු පිළිකා රෝගයකින් පෙලෙන බවත් ශල්‍යකර්මවලට ලක්කර ඇති නිසා තම කටයුතු කරගෙන යාමට අපහසු බැවින් ප්‍රතිකාර සඳහා යම් ආධාර මුදලක් ලබාදෙන ලෙසත් එම මුදල් ලබාදෙන්නේ නම් තම මව වන පී මල්ලිකා ස්වර්ණලතා මියට ලබාදෙන ලෙසත් ඉල්ලා ඇත.ඒ අනුව රු.25,000.00ක ආධාර මුදලක් ලබාදීම සඳහා අණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

රු.25,000.00 ආධාර මුදලක් ලබාදීමට තීරණය විය.

## ඉ).II.29

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පැරණි සතිපොළ අංක 19 කඩ කාමරය කේ.ජී.සුමනසිංහ යන අයට අයිති බවත් ඔහු මෙවන විට ජීවතුන් අතර නොමැති බැවින් ඔහු විසින් ඔහුගේ පුතාවන කේ.ජී.පියතිස්ස යන අයට පවරා දෙන බවට ලිපියක් මගින් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර කේ.ජී.පියතිස්ස යන අයද ජීවතුන් අතර නොමැති බැවින් ඔහුගේ බිරිඳවන ජී.ආර්.සමන්තා කුමාරි මියට පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක විසින්ද අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර ඇති අතර මෙම කඩ කාමරයේ අයිතිය පවරාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යොජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පි.කේ.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අයිතිය පවරාදීමට තීරණය විය.

## ඉ).II.30

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

නො 32/12,හුරිමළුව,රඹුක්කන ලිපිනයෙහි පදිංචි එම්.එච්.එම්.අර්ෂාඩ් මහතා විසින් රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් පැරණි පොදු වෙළඳපොළ භූමියේ අලුතින් ඉදිකරන ලද කඩ කාමර දෙකක් ඇති බැවින් ඉන් එක් කඩ කාමරයක් කුකුළ් මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් ක්‍රමයට ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම කඩ කාමරය ටෙන්ඩර් ක්‍රියාවලියට අනුව ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

කඩ කාමරය ටෙන්ඩර් ක්‍රියාවලියට අනුව ලබාදීමට තීරණය විය.

## ඉ).II.31

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවැත්වෙන ක්‍රීඩා උත්සවයේ එල්ලේ තරඟ පැවැත්වීම සඳහා 2023.02.22 දින සවස බතඹුරය ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ක්‍රීඩාංගනය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගාස්තු අයකිරීමකින් තොරව ක්‍රීඩාංගනය ලබාදීමට තීරණය විය.

## ඉ).II.32

### ගෙවීම් අනුමැතිය

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පහත ගෙවීම් කිරීමට ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

i. කේ.එම්.සී.ඊ.විජේරත්න,ඩී.එස්.අයන් වර්ක්ස්,සී/52,බතඹුරය,රඹුක්කන - රු.445,694.40
(රඹුක්කන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහල මහල් දෙකෙහි වීදුරු ජනෙල් සඳහා ජී.අයි.බට ආවරණ යෙදීම වෙනුවෙන්)

ii. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම,යටගම - රු.24,500.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG-ZA- 0191 දරණ JCB බැකෝ යන්ත්‍රයේ ඩීසල් හිරවීම,අක්‍රිය වූ ඩීසල් ප්‍රෙෂර් පම්ප් එක,පසුපස බැකෝ ආම් එක නව අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම,සේවා කිරීම,ප්‍රවාහනය කිරීම වෙනුවෙන්)

iii. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම,යටගම - රු.33,500.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG-ZA- 0108 දරණ බොබ්කැට් යන්ත්‍රයේ ඉන්ජෙක්ටර් පොම්පයේ ඩීසල් කාන්දුව, අක්‍රිය වූ ස්ටාටර් මෝටරය හා වයර් පද්ධතියේ අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය කරන අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම වෙනුවෙන්)

iv. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම,යටගම - රු.606,500.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG-52- 6699 දරණ ඉසුසු කැබ් රථයේ ඇංජිමේ පූර්ණ අලුත්වැඩියාවක් සිදුකරගැනීම වෙනුවෙන්)

v. නාමල් සර්විස් සෙන්ටර්,කෑගල්ල පාර,දළුග්ගල,රඹුක්කන - රු.43,765.00
(ප්‍රාදේශීය සභාවට අයත් WP.RD -4337 අංක දරණ 45 DI වැගේ ට්‍රැක්ටරය පූර්ණ වාර සේවාවකට ලක් කිරීම වෙනුවෙන්)

vi. නාමල් සර්විස් සෙන්ටර්,කෑගල්ල පාර,දළුග්ගල,රඹුක්කන - රු38,572.00
(ප්‍රාදේශීය සභාවට අයත් WP.LL -7614 අංක දරණ ෆෝටෝන් කෲ කැබ් රථයේ පූර්ණ වාර සේවාවකට ලක් කිරීම වෙනුවෙන්)

vii. නාමල් සර්විස් සෙන්ටර්,කෑගල්ල පාර,දළුග්ගල,රඹුක්කන - රු.10,000.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG-ZA- 0191 දරණ JCB බැකෝ යන්ත්‍රය සඳහා ග්‍රීස් නිපල් 50ක් සඳහා හයිප්‍රෙසර්වලින් ග්‍රීස් ගසාගැනීම වෙනුවෙන්)

viii. සේනාලි ඔයිල් සෙන්ටර්, රෝහල පාර,රඹුක්කන - රු20,250.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG-ZA- 0191 දරණ JCB බැකෝ යන්ත්‍රය සඳහා අඩු හයිඩ්‍රොලික් ඔයිල් ලීටර් 15 සපයාගැනීම වෙනුවෙන්)

ix. තාරක බැටරි වර්ක්ස්,රෝහල පාර,රඹුක්කන - 103,800.00
(ප්‍රාදේශීය සභාවට අයත් SG.RD-7990 අංක දරණ 350 DI ස්ටෑන්ඩඩ් කසල ප්‍රවාහන ට්‍රැක්ටර් රථයට හා SG.ZA – 0191 අංක දරණ JCB බැකෝ යන්ත්‍රය සඳහා 12² - AMP.95.31R ලූකස් බැටරි දෙකක් සපයාගැනීම වෙනුවෙන්)

x. බොලගම සිට දිගනවත්ත දක්වා ඇති කනත්ත මාර්ග ය සංවර්ධනය කිරීම - රු.44,400.00
(බොලගම සිට දිගනවත්ත දක්වා ඇති කනත්ත මාර්ගයේ ආරම්භක ස්ථානය සකස් කිරීම වෙනුවෙන්)

xi. එස්.එම්.කේ.බී.සමරකෝන්,සමරකෝන් ට්‍රේඩර්ස්,තෝමස් සිල්වා මාවත,රඹුක්කන - රු.11,290.00
(සභාව සතු කඩ කාමරයක අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන්)

xii. එස්.එම්.කේ.බී.සමරකෝන්,සමරකෝන් ට්‍රේඩර්ස්,තෝමස් සිල්වා මාවත,රඹුක්කන - රු.25,000.00
(කොම්පෝස්ට් අංගනයේ පොලිතීන් සම්පීඩක යන්ත්‍රයෙන් සාදනු ලබන සම්පීඩක කුට්ටි පුත්තලම ප්‍රදේශයට රැගෙන යාමට ගැටගැසීම සඳහා නයිලෝන් ලණු රෝල් 10ක් සැපයීම වෙනුවෙන්)

xiii. එස්.එම්.කේ.බී.සමරකෝන්,සමරකෝන් ට්‍රේඩර්ස්,තෝමස් සිල්වා මාවත,රඹුක්කන - රු.31,600.00
(කාර්යාල ඉදිරිපස කොටසේ, ගේට්ටුව,වැට,Interlock ගල් ආදියේ ආලේප කිරීමට අවශ්‍ය තීන්ත ඇතුළු පින්තාරු ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන්)

xiv. Kegalle distributors(pvt)Ltd, No 80, Molamure Mawatha, Kegalle - රු.107,064.00
(ආදාහනාගාරය වෙත 37.5Kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 06ක් මිලදීගැනීම වෙනුවෙන්)

xv. H.M.C.M. හේරත්, PC Workstation, නො 119, බෞද්ධාලෝක මාවත, පුවක්ගස්හන්දිය- රු.17,900.00
(සංවර්ධන අංශයේ මාර්ග විෂයට ආදාළව ලබාදී ඇති පරිගණක අලුත්වැඩියා කිරීම වෙනුවෙන්)

xvi. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.44183.91
(සභාව සතු WP.LL – 7614 අංක දරණ ෆෝටෝන් කෑබ් රථයේ රක්ෂණාවරණය 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණාවරණය සිදුකිරීමටත්, ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xvii. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.88,991.58
(සභාව සතු WP.ZA – 5344 අංක දරණ SANY SAG 100 මෝටර් ග්‍රේඩරයේ 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණාවරණය සිදුකිරීම හා ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xviii. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.104,316.44
(සභාව සතු WP.LL - 6393 අංක දරණ ෆෝටෝන් ධුමට්‍රක් රථයේ රක්ෂණාවරණය 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණාවරණය සිදුකිරීමටත්, ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xix. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.33,174.18
(සභාව සතු SG.RD - 7990 අංක දරණ 350 DI ස්ටැන්ඩඩ් කසල ප්‍රවාහන ට්‍රැක්ටරය හා SG.RX - 1980 අංක දරණ විමල් ගලි බවුසර් ට්‍රැක්ටර් ට්‍රේලරය 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණාවරණය සිදුකිරීමට හා ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xx. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.26,155.85
(සභාව සතු SG.RD – 8010 අංක දරණ 350 DI ස්ටැන්ඩඩ් කසල ප්‍රවාහන ට්‍රැක්ටරය හා SG.RX – 1992 අංක දරණ ට්‍රැක්ටර් ට්‍රේලරය 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීමටත් ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xxi. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.22022.47
(සභාව සතු SG.RD – 8009 අංක දරණ 350 DI ස්ටැන්ඩඩ් කසල ප්‍රවාහන ට්‍රැක්ටරය හා SG.RX – 2006 අංක දරණ ජල බවුසර් ට්‍රැක්ටර් ට්‍රේලරය 2023.02.24 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීමටත් ණය පදනම මත සිදුකර ඇති රක්ෂණාවරණය ගෙවීම වෙනුවෙන්)

xxii. සුරමයා සෙරමික්,කුරුණෑගල පාර,රඹුක්කන - රු.97,980.00
(කාර්යාලයේ රාජකාරී මේස මත පරිගණක තබා භාවිතයට ගන්නා නිලධාරීන්ගේ පරිගණකවලට වෙන්වෙන්ව විදුලි සම්බන්ධතාව ලබාදී විදුලි පද්ධතිය ක්‍රමවත්ව සැකසීමට අවශ්‍ය විදුලි උවාරණ සැපයීම වෙනුවෙන්)

xxii. Bhasitha Graphics, no 75, Mainstreet, Rambukkana - රු. 9,900.00
(2023/01/10 මහ සභා වාර්තා කට්ටල 50 ක් මුද්‍රණය කරදීම වෙනුවෙන් )

අදාල ගෙවීම් සහිත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ඉහත ගෙවීම් අනුමත කිරිමට තීරණය විය.

## ඉ). II.33 මිල ගණන් කැඳවීම.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

i. රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ බ්‍රේල්මැෂින් එක සඳහා හයිඩ්‍රොලික් ලීටර් 32ක් මිලදීගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | මිලදී ගන්නා භාණ්ඩය | සිදුකර දෙනු ලබන ඒකක මිල ගණන | | |
|---|---|---|---|---|
| | | සෙනාලි ඔයිල් සෙන්ටර් - රෝහල පාර, රඹුක්කන | කිත්මිණි මෝටර්ස්, 111/ඒ,කුරුණෑගල පාර රඹුක්කන | රඹුක්කන විවිධ සේවා සමිතිය |
| 1 | හයිඩ්‍රොලික් ඔයිල් | රු.1692.85 | රු.1500.00 | රු.1730.00 |

ඒ අනුව අවම මිල ගණන් යටතේ හයිඩ්‍රොලික් ඔයිල් මිලදීගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී ධර්මසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ හයිඩ්‍රොලික් ඔයිල් මිලදීගැනීමට තීරණය විය.

ii. රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොහොර හලන මැෂින් එක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | අයිතමය | සපයනු ලබන ඒකක මිල ගණන | | |
|---|---|---|---|---|
| | | S PLUS AUTO ELECTRICAL, Wahawa, Rambukkana | Jagath Electrical and All Vehical Repairs, Eriyawa Road, Wahawa, Rambukkana | රසික ඉලෙක්ට්‍රිකල්, නො 544, වහව පිරිවෙන පාර, රඹුක්කන |
| 1 | B 35 බෙල්ට් 02 | රු.4800.00 | රු.5100.00 | රු.4750.00 |
| 2 | B 104 බෙල්ට් 02 | රු.8600.00 | රු.8950.00 | රු.8900.00 |
| 3 | ඔයිල් 1L | රු.2800.00 | රු.2950.00 | රු.3000.00 |
| 4 | ග්‍රීස් 500g | රු.1800.00 | රු.2000.00 | රු.1980.00 |
| 5 | වැඩ කුලිය | රු.3500.00 | රු.4500.00 | රු.4000.00 |

ඒ අනුව අවම මිල ගණන් යටතේ අවශ්‍ය ද්‍රව්‍යයන් යොදා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී ධර්මසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අවශ්‍ය ද්‍රව්‍යයන් යොදා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට තීරණය විය.

iii. සභාව සතු WP.RD -4337 අංක දරණ 45 DI වැගේ ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය ,වම් හා දකුණු මඩගාඩ්,දිරාගිය ආයුද පෙට්ටිය,ඇදවිගිය සයිලන්සරය, සිග්නල් ලයිට් ආදිය අලුත්වැඩියා කරගැනිම සඳහා කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | අරවින්ද මෝටර්ස්, ඉහල වල්පොල, කොටවැල්ල, රඹුක්කන | රු.86,500/= |
| 02 | තරිඳු මෝටර්ස්, මීදුම, යටගම, රඹුක්කන | රු. 80,000/= |
| 03 | සේන මෝටර්ස්, නො 02, කරුණාරත්නගම, රඹුක්කන | රු. 87,000/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට තීරණය විය.

iv. සභාව සතු SG.YU - 6935 අංක දරණ බජාජ් ත්‍රිරෝද රථයේ බොඩිය සම්පූර්ණයෙන්ම ගලවා ඉවත් කර දිරාගිය කොටස් වෙනුවට අලුතින් තහඩු යොදා ටින්කර් වැඩ,පේන්ට් වැඩ,පැස්සුම් වැඩ අවසන් කර ටෙන්ට් එක ගැසීම ආදී සියලුම අලුත්වැඩියාවන් සිදු කිරිමට කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | අරවින්ද මෝටර්ස්, ඉහල වල්පොල, කොටවැල්ල, රඹුක්කන | රු.400,000/= |
| 02 | තරිඳු මෝටර්ස්, මීඳුම, යටගම, රඹුක්කන | රු. 388,500/= |
| 03 | සුසන්ත මෝටර්ස්, නො 02, කරුණාරත්නගම, රඹුක්කාන | රු. 400,500/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබු අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිමට තීරණය විය.

v. සභාව සතු SG.ZA - 0191 අංක දරණ JCB බැකෝ යන්ත්‍රයේ බැකෝ ආම් බකට් එකේ ගෙවිගිය බුෂ්,පින්,ප්ලේ වොෂර් ඉවත් කර අලුතින් ඒවා ලියවා සවි කිරිමට හා වැද්දීමට,දිරාගිය හයිඩ්‍රොලික් හෝස් අලුතින් දැමීමට,බැකෝ පැන් ප්‍රෙෂර් හෝස් ලයින් දෙක සවිවන බකට් දෙකේ කැඩිගිය ඇණ සෙට් එක දැමීමට,හෝස් ලයින්,මඩ්ගාඩ්,ආදිය අලුත්වැඩියා කිරිමට කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | අරවින්ද මෝටර්ස්, ඉහල වල්පොල, කොටවැල්ල, රඹුක්කන | රු.70,250/= |
| 02 | තරිඳු මෝටර්ස්, මීඳුම, යටගම, රඹුක්කන | රු. 69,500/= |
| 03 | සුසන්ත මෝටර්ස්, නො 02, කරුණාරත්නගම, රඹුක්කන | රු. 71,300/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබු අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිමට තීරණය විය.

vi. මාර්ග අංශයට අයත් තණකොල කපන මැෂින් එක අලුත්වැඩියා කිරිම සඳහා කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | සුපුන් ට්‍රේඩ් සෙන්ටර්,නො 155/ඩී, කුරුණෑගල පාර, රඹුක්කන | රු.13,440/= |
| 02 | සුපුන් ඉලෙක්ට්‍රිකල් ට්‍රේඩ් සෙන්ටර්, නො 215, කෑගල්ල පාර, පොල්ගහවෙල | රු. 14,450/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිමට තීරණය විය.

vii. වරිපනම් අංශයේ ප්‍රින්ටරය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | PC Workstation, no 119, Bauddhaloka Mawatha, puwakgas junction, kurunegala | රු.12,200/= |
| 02 | OMMATA Trade CCenter,no 58/2,Sumangala Mawatha Puttalam Road,Kurunegala | රු.16,000/= |
| 03 | Global Office Solution Private Limited,No 112,Bauddhaloka Mawatha,kurunegala | රු.15,500/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අලුත්වැඩියා කටයුතු සිදු කිරිමට තීරණය විය.

viii. රඹුක්කන ප්‍රාදේශීය සභාව අයත් නගර සභා නිවාස සංකීර්ණයේ ඇති නිවෙස්වලට අනතුරුදායක අඹ ගස් 03ක් හා කොස් ගස් ඉවත් කිරීම සඳහා පහත මිල ගණන් ලැබී ඇත.

| අනු අංකය | නම | මිල ගණන |
|---|---|---|
| 1 | එච්.ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර | රු.14,100.00 |
| 2 | ඩබ්.රජිත ශ්‍රීමාල් | රු.14,200.00 |
| 3 | අයි.පි.සුනිල් ප්‍රේමරත්න | රු.14,350.00 |

ඒ අනුව ලැබී ඇති වැඩිම මිල ගණන් යටතේ ගස් කපා ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්. ප්‍රසන්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

වැඩිම මිල ගණන යටතේ ගස් කපා ඉවත් කිරීමට තීරණය විය.

**ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සළකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස,ඒවා සළකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමා**

2023.01.31 යන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැලසීමේ කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමන් විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

2023.01.31 යන දිනවල පැවත්වූ මුදල් හා ප්‍රතිපත්ති සැලසීමේ කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට තීරණය විය.

**උ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම.**

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මංමාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| 10 වරිපනම් බදු | 4,139,580.96 | 19,200.00 | - | - | 95,000.00 | 4,253,780.96 |
| 20 කුලී | - | - | 129,533.33 | 659,846.65 | 96,438.00 | 885,817.98 |
| 30 බලපත්‍ර සේවා | 86.00 | 30,700.00 | 258,466.67 | - | - | 289,252.67 |
| 40 සේවා සඳහා ගාස්තු | 5,700.00 | 383,100.00 | 58,918.80 | - | - | 447,718.80 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | - | - | - | 14,187.00 | 864.00 | 15,051.00 |
| 60 වෙනත් ආදායම් | 9,792,243.82 | 25,750.00 | 5,300.00 | - | 240.00 | 9,823,533.82 |
| 70 වෙනත් ආදායම් | 3,187,120.00 | 1,021,166.26 | 899,359.51 | 167,908.33 | 374,080.00 | 5,649,634.10 |
| පුනරාවර්තන ආදායම් එකතුව | **17,124,730.78** | **1,479,916.26** | **1,351,578.31** | **841,941.98** | **566,622.00** | **21,364,789.33** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව | **17,124,730.78** | **1,479,916.26** | **1,351,578.31** | **841,941.98** | **566,622.00** | **21,364,789.33** |
| සේවක ණය | | | | | | |
| මහජන බැංකුව-සේවක ණය | 1,600.00 | | | | | 1,600.00 |
| ලංකා බැංකුව-සේවක ණය | 486,611.45 | | | | | 486,611.45 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 748,495.75 | | | | | 748,495.75 |
| සමුච්චිත අරමුදල | 130,170.00 | | | | | 130,170.00 |
| [illegible] | 6,500.00 | | | | | 6,500.00 |
| අත්තිකාරම් | 64,792.72 | | | | | 64,792.72 |
| [illegible] ලැබීම් | - | | | | | - |
| වෙනත් ලැබීම් | 11,540.00 | | | | | 11,540.00 |
| මුළු එකතුව | **18,574,440.70** | **1,479,916.26** | **1,351,578.31** | **841,941.98** | **566,622.00** | **22,814,499.25** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මංමාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| 10 වැටුප් දීමනා | 3,333,885.57 | 979,947.72 | 898,925.00 | 42,860.00 | 372,300.00 | 5,627,918.29 |
| 20 ගමන් වියදම් | 20,974.00 | 350.00 | 5,890.00 | - | - | 27,214.00 |
| 30 සැපයුම් හා උපකරණ | 23,478.00 | - | - | - | 620.00 | 24,098.00 |
| 40 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 20,800.00 | 61,500.00 | 104,045.00 | 15,340.00 | 32,300.00 | 233,985.00 |
| 50 ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යතා හා වෙනත් සේවා | 196,647.64 | - | - | 63,946.97 | 12,416.74 | 273,011.35 |
| 60 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | - | - | - | - | - |
| 70 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 14,541.56 | 22,149.21 | - | - | 35,412.48 | 72,103.25 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - | - | - | - | - | - |
| පුනරාවර්තන වියදම් එකතුව | **3,610,326.77** | **1,063,946.93** | **1,008,860.00** | **122,146.97** | **453,049.22** | **6,258,329.89** |
| 09 ප්‍රාග්ධන වැය | - | | 108,980.00 | | | 108,980.00 |
| 10 ණය ආපසු ගෙවීම | - | | - | | | - |
| ප්‍රාග්ධන වැය එකතුව | - | - | **108,980.00** | - | - | **108,980.00** |
| පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව | **3,610,326.77** | **1,063,946.93** | **1,117,840.00** | **122,146.97** | **453,049.22** | **6,367,309.89** |
| සේවක ණය | | | | | | |
| මහජන බැංකුව-සේවක ණය | 708,000.00 | | | | | 708,000.00 |
| ලංකා බැංකුව-සේවක ණය | 132,596.00 | | | | | 132,596.00 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| තැන්පත් | 477,057.35 | | | | | 477,057.35 |
| විවිධ ණයහිමියෝ | 3,140,272.10 | | | | | 3,140,272.10 |
| ගබඩා ණයහිමියෝ | 366,654.00 | | | | | 366,654.00 |
| අත්තිකාරම් | 689,335.96 | | | | | 689,335.96 |
| සමුච්චිත අරමුදල | 2,000.00 | | | | | 2,000.00 |
| ආයෝජන | - | | | | | - |
| වෙනත් ගෙවීම් | - | | | | | - |
| මුළු එකතුව | **9,126,242.18** | **1,063,946.93** | **1,117,840.00** | **122,146.97** | **453,049.22** | **11,883,225.30** |

## ඌ) වෙනත් කාරණා

### 1. ගරු සභාපති අතුල හදගම මැතිතුමා

කීර්තිරත්නාරාම විහාරයේ කාර්මික පුහුණු මධ්‍යස්ථානයක් රජයේ අනුග්‍රහය ඇතිව පවත්වාගෙන යන බවත් ඒ සඳහා අවශ්‍ය කරන ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ නිම කරගැනිම සඳහා 2023.02.25 දින එම විහාරයේ පැවැත්වෙන ගිරිභාණ්ඩ පූජාවක් මෙන්ම සමන් දේව මන්දිරයට මුල්ගල තැබීම,ශ්‍රීපාද පද්මයට මුල්ගල තැබීම ආදී කටයුතු සඳහා සහභාගිවන ලෙස එම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් දන්වා ඇති අතර ඒ සඳහා හැකි අයුරින් උපකාර කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදී.

**2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා**

රඹුක්කන නගරයේ ප්‍රධාන වට රවුම තුළ දැන්වීම් පුවරු ගසා ඇති අතර ඒ නිසාවෙන් මාර්ග පැහැදිලිව නොපෙනීම මාර්ගයේ ගමන් කරන වාහන සඳහා අනතුරුදායක වී ඇති බවත් නගරය තුළ දැන්වීම් පුවරු සවිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් අනුමත කිරීම අනිවාර්ය වන අතර යම්කිසි අනතුරක් සිදු වුවහොත් ඒ සඳහා වගකීම සභාව විසින් බාරගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

එම දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීම සඳහා කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සිරිසේන මැතිතුමා**

අරගල කාලවලදී පවා මෙම වට රවුම තුළ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරනු ලැබුවත් කිසිදු අවස්ථාවක අදහස් දැක්වීමක් සිදු නොකළ බව ගරු මැතිතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමා**

මෙම වට රවුම දැන්වීම් පුවරු ආදිය ප්‍රදර්ශනය කරන ස්ථානයක් නොවන බවත් මාර්ගයේ ගමන් කරන වාහනවලට ඉදිරියෙන් පැමිණෙන වාහන පැහැදිලිව පෙනිය යුතු බැවින් එවැනි කටයුතු සඳහා අවස්ථාව නොදිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පැවසූ අතර එම ස්ථානයේ දැන්වීම් ඇලවීම නොකල යුතු බව ප්‍රදර්ශනය කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

**3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා**

නාමල්ගමුව ප්‍රජා ශාලාව සභාව සතු දේපලක් වන අතර එහි ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබුවත් එම කටයුතු ක්‍රියාත්මක නොවූ බවද එම ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

**4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා**

සෑම මසකම ඉදිරිපත් කරන ආදායම් වියදම් ප්‍රගති වාර්තාව අකුරු ප්‍රමාණය කුඩා නිසා පැහැදිලිව නොපෙනෙන අතර එය පැහැදිලිව දැක්වීම සුදුසු බව ගරු මැතිතුමන් විසින් පවසන ලදි.

<u>**අවසානය**</u>

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.11.45 ට පමණ අවසන් කරන ලදි.

**ඊ.එම්.ඒ.එන්.බී හඳගම,**
**සභාපති,**
**රඹුක්කන ප්‍රාදේශීය සභාව.**

ඒ. මු. අතුල නි. බ. හඳගම
සභාපති
රඹුක්කන ප්‍රාදේශීය සභාව